සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

23 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................  දේශපාලන විද්‍යාව I  කාලය පැය දෙකයි

- **මෙම ප්‍රශ්න පත්‍රය A - B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

- **අංක 1 සිට 11 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.**

01. දේශපාලනය,
A සීමිත සම්පත් හිමිකර ගැනීම සඳහා සිදුකෙරෙන අරගලය දේශපාලනයයි.
B සමාජයෙහි ක්‍රියාත්මකවන අරගලව දේශපාලනයයි.
C මිනිස් ජීවිතයේ සමාජීය කටයුතු සෘජු ලෙසද මිනිස් ජීවිතයේ පෞද්ගලික කටයුතු වක්‍ර ලෙසද බද්ධ වනුයේ දේශපාලනයයි.
D සමාජයේ පන්ති අරගලය මර්දනය කිරීම දේශපාලනයයි.
E සමාජ සංදර්භය තුළ මතුනොවන සුවිශේෂී ක්‍රියාදාමය දේශපාලනයයි.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

02. දේශපාලනය යනු, පුරවැසියන් දේශපාලන ක්‍රියාවලියට සහභාගීවීමයි. ඒ අනුව දේශපාලනය තුළ පුරවැසියන්ගේ කාර්ය වන්නේ,
A ඡන්දය දීම.
B දේශපාලන පක්ෂවල සාමාජිකත්වය දැරීම.
C තමන් කැමති, අපේක්ෂකයන් වෙනුවෙන් ඡන්ද ප්‍රචාරක වැඩකිරීම.
D බලය ලබාගැනීමේ ක්‍රියාවලියෙහි නිරතවීම.
E ආණ්ඩුවේ කාර්යයන් කිරීම සඳහා නියෝජිතයන්ට බලය පැවරීම.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

03. බහු විෂයික ප්‍රවේශය මගින්,
A දේශපාලන විද්‍යාව නිශ්චිත ශාස්ත්‍රීය විෂයක් ලෙස අනන්‍යව පැවතිය යුතුබව පිළිගනී.
B දේශපාලන විද්‍යාව විග්‍රහයට බාහිර ශික්ෂණයන්ගේ න්‍යාය සහ සංකල්ප යොදාගනී.
C සමාජයේ අනෙකුත් පැතිකඩ සමගද දේශපාලනය අඩුවැඩි ලෙස සම්බන්ධ වියයුතු බව පිළිගනියි.
D විසිවන සියවසේදී දේශපාලන අධ්‍යයනය සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව වැනිවිෂයන්ගෙන් පෝෂණය වී ඇති බව පිළිගනී.
E දේශපාලන විද්‍යාවවෙනත් ශික්ෂණ ධාරාවන් සතු විධික්‍රම සමගද සම්බන්ධ වියයුතු බව පිළිගනී.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

04. රාජ්‍යය,

A සමාජයේ අනෙක් ආයතන වලට සහ පුද්ගලයන්ට බලහත්කාරී බලය පාවිච්චි කිරීමේ අයිතිය සහිතය.
B පරමාධිපත්‍ය බලය හිමි එකම ආයතනය වේ.
C භූමි ප්‍රදේශය තුළ නීති සම්පාදනය, නීති ක්‍රියාත්මක කිරීම, යුක්තිය පසිඳලීමට බලය හිමිවේ.
D පරමාධිපත්‍ය බලය මගින් රාජ්‍ය තුළ හා රාජ්‍යය දේශ සීමාවෙන් පිටත මනුෂයයන් මෙහෙයවීමේ බලය සහිත වේ.
E අනෙකුත් සෑම මනුෂ්‍ය සංවිධානයක්ම රාජ්‍යයට යටත්වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

05. සීමිත ආණ්ඩු යනු,

A ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලධර්මයකි.
B පාලකයින්ගේ බලය සීමාවන්ට යටත් කරවන්නකි.
C මේ සම්බන්ධව ප්‍රථම වරට අදහසක් දැක්වූයේ ජෝන් ලොක්ය.
D මෙය මිනිසුන්ගේ පාලනය නොව නීතියේ පාලනයයි. (Rule by law not by men)
E සීමිත ආණ්ඩු ක්‍රියාවට නංවන පිරිස ආයතනික ලෙසත් සීමාවන්ට හා සංවරණයන්ට ලක් නොවෙයි.

1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

06. ජෝන් ලොක් නූතන ප්‍රජාතන්ත්‍රවාදයට අවශ්‍ය මූලික සංකල්ප ගණනාවක් සමාජ ගිවිසුමෙන් ඉදිරිපත් කළේය. ඒවා අඩංගු පිළිතුරු කාණ්ඩය නම් කරන්න.

A සීමිත බලතල සහිත පාලනය.
B ව්‍යවස්ථානුකූල පාලනය.
C බලතල බෙදීම.
D කොන්දේසි විරහිත අසහාය බලය.
E පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය සංකල්පය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

07. නිදහස් හා සාධාරණ මැතිවරණයක මූලික ලක්ෂණ වනුයේ,

A කාලීනව මැතිවරණ පැවැත්වීම.
B නුසුදුසුකම් නොසලකමින් සෑම අයෙකුටම ඡන්ද බලය ලබාදීම.
C සුදුසුකම් සහිත ඕනෑම අයෙකුට අපේක්ෂකත්වයට තරඟ කළ හැකිවීම.
D ඡන්ද ප්‍රතිඵල විවෘතව හා නිවැරදිව දැක්වීම.
E ඡන්ද දායකයාලේ ස්ව කැමැත්ත මත තීරණගැනීමට ඉඩ හැරීම.

1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

08. ද්විපක්ෂ ක්‍රමය සම්බන්ධරෙයන් වැදගත් වනුයේ,

A ප්‍රජාතන්ත්‍රවාදයත් දේශපාලන ස්ථාවරභාවයත් ආරක්ෂා වේ.
B කුඩා දේශපාලන පක්ෂ වේගයෙන් ඉදිරියට පැමිණේ.
C දේශපාලන ක්‍රමයට ප්‍රබල බලපෑමක් කළහැකි වේ.
D සමාජ විභේදනය අඩු රාජ්‍යවල ද්විපක්ෂ ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වේ.
E සරල බහුතර නියෝජනය මේ සඳහා බෙහෙවින් බලපායි.

1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

09. නීතියේ ආධිපත්‍යයෙන් අදහස් වන්නේ,

A නීතිය සැමට සමානවිය යුතු බවයි.
B නීතියෙන් සැමට සමාන ආරක්ෂාව හිමිවිය යුතු බවයි.
C මිනිසුන්ගේ පාලනය නීතියේ ආධිපත්‍යය බවය.
D ආණ්ඩුවේ පාලන කටයුතුවලට සම්බන්ධවන සියලු අය නීතියට ඉහළින් නොව නීතියට යටත්ව සිටිය යුතු බවය.
E නීතියේ ආධිපත්‍යයෙන් පුද්ගල නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂාවිය යුතු බවය.

1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

10. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පැවැත්ම සඳහා අවශ්‍ය වන ගුණාංග දැක්වෙන ප්‍රකාශ කාණ්ඩය කුමක්ද?
A ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
B නිදහස් හා සාධාරණ මැතිවරණ
C තරඟකාරී පක්ෂක්‍රමය
D වෙළඳපොළ සම්බන්ධ නිදහස් වරණය.
E රාජ්‍ය උත්තරීතරවීම හා ආධිපාලනය
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

11. ෆැසිස්ට්වාදය යටතේ රාජ්‍ය උත්තරීතරකොට සලකනුයේ,
A රාජ්‍යයෙන් ප්‍රකාශවන්නේ මුළු ජාතියේම ජේෂ්ඨත්වය ගෞරවය සහ ඉරණමය.
B මෙම දේශපාලන ක්‍රමයෙහි රාජ්‍යයෙන් වෙන්වූ හා ස්වාධීනවූ පෞද්ගලික නිදහසක් නැති නිසාය.
C නිදහස සාක්ෂාත් වනුයේ බලයට අධිකාරියට සහ නායකයාට යටත් වීමෙන් වන නිසාය.
D සෑම පුරවැසියෙකුම කොන්දේසි විරහිතව රාජ්‍යයේ බලාධිකාරියට යටත්විය යුතු නිසාය.
E මෙමගින් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිතවන නිසාය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

- **අංක 12 සිට 20 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ 5 අතරින් එක් ප්‍රකාශයක් හෝ ප්‍රකාශ කාණ්ඩයක් වැරදිය. වැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

12. ලිබරල් නිරාගාමිකවාදයේ මූලධර්මයක් නොවන්නේ,
1. රාජ්‍යය සහ පල්ලිය ආයතනික වශයෙන් වෙන් කිරීම.
2. ආගමිකත්වය මත කිසිදු පුරවැසියෙකුට වෙනස්කමක් නොකළ යුතු බව.
3. රාජ්‍යය කිසිම ආගමකට පක්ෂපාතීත්වයක් නොදැක්විය යුතු බව.
4. රාජ්‍යය ආගම සමග අනන්‍ය නොවීම.
5. ආගමට පැවතිය හැක්කේ රාජ්‍යයේ අවසරය මත පමණක් බව. (.....)

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,
1. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික පදනම වේ.
2. රටේ මූලික නීතිය ලෙස සැලකේ.
3. රාජ්‍යය සහ ආන්ඩුව සංවිධානය කිරීමේ මූලධර්මවල එකතුව වේ.
4. ආණ්ඩුක්‍රමයේ නීතිමය පදනම වේ.
5. රාජ්‍යයේ ප්‍රතිපත්ති පමණක් දක්වන ලියවිල්ලකි. (.....)

14. ගැටුම,
1. සමහර සමාජයන්හි පමණක් තිබෙන්නා වූ සමාජ ප්‍රපංචයක් වේ.
2. පුද්ගල හා කණ්ඩායම් වල බහුවිධ ආශාවන් ප්‍රකාශ කිරීමේ එක් මාධ්‍යයක් වේ.
3. කාල් මාක්ස්ට අනුව ගැටුම සමාජ ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය දෙයකි.
4. පුද්ගල හා සමාජ විවිධත්වයේ අවසානප්‍රතිඵලය වේ.
5. ප්‍රවර්ධනාත්මක මෙන්ම විනාශකාරීද විය හැක. (.....)

15. සන්ධීය ආන්ඩුක්‍රමයේ වාසි ගණයෙහිලා සැලකිය නොහැක්කේ කුමන ප්‍රකාශයද?
1. බහුවිධ සමාජයක් එක්කොට එක් ජාතියක් බවට පත්කිරීමේ මාධ්‍යයක් වීම.
2. විශාල රටක් පහසුවෙන් සංවර්ධනය කළහැකි වීම.
3. එකට එක්වීම නිසා කුඩා රාජ්‍යවල පැවැත්ම සහතිකවීම.
4. කැරලි ත්‍රස්තවාදී ක්‍රියාතුලින් වෙන්වීමේ ප්‍රවණතා අධිකවීම.
5. ස්වයං පාලනය අයිතිය හා පෞද්ගලික නිදහස ඇතිකර ගැනීම. (.....)

16. බ්‍රිතාන්‍ය දේශපාලන ක්‍රමය,
1. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සමඟ ක්‍රියාත්මක වේ.
2. නිර්ලිඛිතවන අතර පහසුවෙන් සංශෝධනය කළහැකි වේ.
3. දේශපාලන විධායකය ලෙස රැජිණ කටයුතු කරයි.
4. ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ පෙන්නුම් කරයි.
5. සම්ප්‍රදායන් මත ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වේ. (.....)

17. ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයේ,
1. ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයෙන් තෝරාපත් කරනු ලැබේ.
2. ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය දුෂ්කර අපහසු කාර්යයක් වේ.
3. 1789 ස්ථාපිත කළ ලෝකයේ ප්‍රථම ව්‍යවස්ථාව වේ.
4. බලතල බෙදීමේ මූලධර්මය මත ක්‍රියාත්මක වේ.
5. ප්‍රාන්ත රාජ්‍යය පනහකින් යුත් සංධීය රාජ්‍යයක් වේ. (.....)

18. 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව,
A ජනාධිපති ධූරයේ අධිකාරී බලට තවදුරටත් අහෝසි කර නැත.
B විධායකයේ ස්ථාවරභාවය ස්ථාපිත කර ඇත.
C අධිකරණ සේවය ස්වාධීන කිරීමට පියවර ගෙන නැත.
D සියලුම අමාත්‍යාංශ ජනාධිපතිවරයාට පවරා ඇත.
E එක් පුද්ගලයෙකුට ජනාධිපති ලෙස පත්වීමේ වාර ගණන දෙකකට සීමා කර ඇත.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

19. කැබිනට් ආණ්ඩුක්‍රමය,
A බහු පක්ෂ ක්‍රමයක් සහිත රටවලට වඩාත් සුදුසුය. B රාජ්‍යයේ නායකයා ලෙස අගමැති කටයුතු කරයි.
C ස්ථාවර ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ. D ප්‍රජාතන්ත්‍රවාදී භාවයෙන් අඩුවුවද වඩාත් කාර්යක්ෂම වේ.
E සාමූහික වගකීමේ මූලධර්මය මත රඳ පවතී.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

20. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමයේ ප්‍රජාතන්ත්‍රවාදී නොවන අංග ලක්ෂණ වනුයේ
A හදිසි නීතිය සහ ඒ යටතේ මූලික අයිතිවාසිකම් අත්හිටුවීම.
B මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම.
C ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළ සිදුවන දූෂණය සහ බලය අවභාවිත කිරීම.
D නිදහස් සහ සාධාරණ මැතිවරණ මූලධර්ම උල්ලංඝණය කිරීම.
E සාපේක්ෂ වශයෙන් ස්වාධීන අධිකරණය.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

- **21 සිට 24 දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

21. කෝල්බෲක් යෝජනා මගින් උඩරට පහතරට ඒකාබද්ධ කර ඒකීය පාලනයක් යෝජනා කළේ,
A උඩරට ප්‍රධානීන්ගේ බලය මර්දනය කිරීමටය. B මූල්‍ය වියදම් අඩුකර ලීමටය.
C පරිපාලනය මධ්‍යගත නොකිරීමටය. D රට තුළ පැවති අනවශ්‍ය භේද, ආර්ථික බාධක ඉවත්කිරීමට.
E නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ බීජ රෝපණය කිරීමටය.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

22. ඩොනමෝර් කොමිසම විධායක කාරකසභා ක්‍රමයක් ප්‍රධානය කිරීමට බලපෑ හේතු සාධක සම්බන්ධයෙන් අදාළ ප්‍රකාශ වනුයේ,
A විධිමත් පරිපාලන ක්‍රමයක් නොතිබීම. B සමාජය ජාති කුල ආදී වශයෙන් බෙදී පැවතීම.
C වාර්ගික නියෝජනය සමනය කිරීම. D සංවිධානය වූ පක්ෂ ක්‍රමයක් නොතිබීම.
E ස්වයං පාලන අයිතිය හා ජනතා නිදහස ඇතිකිරීම.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

23. සෝල්බරී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා බලපෑ පසුබිම් සාධක අන්තර්ගත වනුයේ,
A බ්‍රිතාන්‍ය ආණ්ඩුව මගින් යටත්විජිත රාජ්‍යයන්ට නිදහස ලබාදීම.
B ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ පැවති දුර්වලතා ඉවත් කිරීම.
C කම්කරු ව්‍යාපාරයේ නැඟී සිටීමට පිළියම් යෙදීම.
D අන්තර්ජාතික සංවිධානවල දුර්වල ක්‍රියාකාරීත්වය.
E හියුක්ලිෆඩ් ආණ්ඩුකාරවරයා විසින් බ්‍රිතාන්‍යයට යැවූ සංදේශය.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

24. සෝල්බරී ව්‍යවස්ථාව අනුව අගමැති සම්බන්ධයෙන් ගැළපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
A අග්‍රාණ්ඩුකාරයා විසින් පත්කළේය. B රාජ්‍ය නායකයා විය.
C ව්‍යවස්ථාදායකයට වගකිව යුතු විය. D කැබිනට් මණ්ඩලය පත්කිරීමේ පූර්ණබලය ඉසිලීය.
E ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය භාරව ක්‍රියාකිරීමය.
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

- **25 සිට 30 දක්වා ඇති සෑම ප්‍රශ්නයක් සඳහාම ප්‍රකාශ දෙකක් අඩංගු කර ඇත. එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහතින් දක්වා ඇති හැඳින්වීම් වලින් කවරක්ද යන්න තෝරා 1, 2, 3, 4 ලෙස ඒවා නම් කරන්න.**

| අංකය | ප්‍රකාශ I | ප්‍රකාශ II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |
| | | |

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 25 | 1972 ව්‍යවස්ථාවට අනුව උත්තරීතර ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාවයි. | එම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා චාරිත්‍රානුකූලව රාජ්‍ය නායකයා හා නාමමාත්‍ර විධායකය විය. (.....) |
| 26 | 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැති ජාතික රාජ්‍ය සභාවට වග නොකියන ලදී. | අගමැති ජාතික රාජ්‍ය සභාවේ බහුතර විශ්වාසය දිනාගත් පුද්ගලයා විය. (.....) |
| 27 | පළාත් ආණ්ඩුකාරවරයා පළාත් සභාවේ විධායකය වේ. | ඔහු පළාත් සභාවට වගකීමට බැඳී නැත. එයට හේතුව ඔහු ජනාධිපති විසින් පත් කිරීමය. ඒ නිසා ඔහු ජනාධිපතිට පමණක් වගකීමට බැඳී සිටියි. (.....) |
| 28 | ශ්‍රී ලංකාවට අවශ්‍යවන බහුත්වවාදී ආන්ඩුක්‍රමයක් අපේක්ෂා කළ හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් පමණි. | මහජන ඡන්දයෙන් ආණ්ඩුමාරු කිරීම ලංකා දේශපාලනයේත් දේශපාලන සංස්කෘතියේත් ඇති ශක්තිමත් හා අඛණ්ඩ ලක්ෂණයයි. (.....) |

- **29 - 30 සාවද්‍ය පිළිතුර තෝරන්න.**

29. 1978 ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතු බලතලඅතර වැරදි සහිත ප්‍රකාශය වනුයේ,
1. පාර්ලිමේන්තුව ඇමතීම, සහභාගිවීම, සංදේශ යැවීම.
2. ස්ව කැමැත්ත මත පමණක් අගමැති හා කැබිනට් මණ්ඩලය පත් කිරීම.
3. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශ කිරීම.
4. පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීම.
5. රටේ නීතිය හා සාමය ස්ථාපිත කිරීම. (.....)

30. ජනාධිපතිවරයාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් නිත්‍යානුකූල නොවන්නේ,
1. රාජ්‍යයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොසලකා වුවද හදිසි තීරණගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ආණ්ඩුවේ ප්‍රධානියා වීම.
4. විධායකයේ ප්‍රධානියා වීම.
5. සන්නද්ධ සේවාවල සේනාධිනායකයා ලෙස කටයුතු කිරීම. (.....)

## B කොටස

31. (i) සංවිධිත සමාජයන්හි අඛණ්ඩව සිදුවන රාජ්‍ය බලය පිළිබඳ අරගලය කුමක්ද?
(ii) මිනිස් ජීවිතය හා එය බද්ධ වී ඇත්තේ කෙසේද?

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

32. දේශපාලන න්‍යායන් ප්‍රභේද දෙකකින් යුක්තය. නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

33. රාජ්‍ය සම්බන්ධයෙන් ඇරිස්ටෝටලියානු අර්ථය සහ වෙබේරියානු අර්ථයෙන් විග්‍රහවන්නේකුමක්දැයි සඳහන් කරන්න.

(i) ඇරිස්ටෝටලියානු අර්ථය - ..........................................................................................

(ii) වෙබේරියානු අර්ථය - ..........................................................................................

34. ඕනෑම රාජ්‍යයක පවතින මූලික හා කේන්ද්‍රීය දේශපාලන ආයතන දෙකක් සඳහන් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

35. (i) ජාතිකත්වය පිළිබඳ හැඟීම මෙන්ම දේශාභිමානය ඉස්මතුවීම සඳහා බලපාන සාධක අතුරින් එක් ප්‍රබල සාධකයක් ලෙස මෙය හැඳින්වේ.

..........................................................................................................................

(ii) අන්‍යයන්ට අණදෙන එහෙත් අන්‍යයන්ගෙන් අණ නොලබන දේශ සීමාව තුළ හා ඉන් පිටත රාජ්‍යය අසහායතත්වයට පත්වී ඇත්තේ මේ නිසාය.

..........................................................................................................................

36. ග්‍රීක ශිෂ්ටාචාරයේ විශේෂත්වයට බලපාන කරුණු දෙකක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

37. මහාචාර්ය යොහාන් ගැල්ටුං විසින් ''සාමය'' යන්න දෙයාකාරව සංකල්ප ගත කර ඇත. නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

38. මාක්ස්වාදීන් රාජ්‍ය දෙයාකාරයකින් සලකා බැලූහ. ඒවා නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

39. ආණ්ඩුවේ වගවීම පිළිබඳ අදහසට මත දෙකක් පවතී. ඒවානම් කරන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

40. නූතනයේ ව්‍යවස්ථානුකූල වාදය තහවුරු වීමට අවශ්‍ය කරන සාධක දෙකක් සඳහන් කරන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

41. ඇමරිකානු මධ්‍යම ආණ්ඩුව ප්‍රාන්ත සම්බන්ධයෙන් පැවරී ඇති බලය කරුණු හතරක් මත රඳ පවතී. එයින් දෙකක් නම් කරන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

42. ලොව බලවත්ව පාර්ලිමේන්තුව ලෙස සැලකෙන්නේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවයි. ඊට බලපාන ලද හේතු දෙකක් ලියන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

43. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක බහුතරය සොයා බලන අවස්ථා ගණනාවකි. ඒවායින් දෙකක් ලියන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

44. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ තුළින් ආණ්ඩුකාරවරයාගේ අසීමිත බලතල වලට සංවරණයක් සැපයීම සඳහා පිහිටවූ දේශපාලන ආයතන නම් කරන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

45. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ සර්වජන ඡන්දබලය ප්‍රධානය කිරීමෙන් ඇතිවූ වාසි දෙකක් ලියන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

46. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සකස් වූයේ ආයතන තුනක එකතුවෙනි. එයින් දෙකක් සඳහන් කරන්න.

(i) ........................................................................................................................

(ii) ........................................................................................................................

47. 1972 ආණ්ඩුක්‍රමය යටතේ පිහිට වූ ජාතික රාජ්‍ය සභාව තරම් 1978 ආණ්ඩුක්‍රමය යටතේ පිහිට වූ පාර්ලිමේන්තුව උත්තරීතර නොවීය. මීට හේතු දෙකක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

48. වර්ථමාන 1978 ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාර දෙකකි. ඒවා නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

49. (i) 19 වන සංශෝධනය යටතේ ජනාධිපතිගේ නිලකාලය පිළිබඳව ඇතිකල වෙනස කුමක්ද?

..........................................................................................................................

(ii)එක් පුද්ගලයෙකුට එම නිලය දැරිය හැකි වාර ගණන කොපමණද?

..........................................................................................................................

50. 1978 ව්‍යවස්ථාව යටතේ අගමැති පත්කරනුයේ කවුරුන් විසින්ද? එම ධූරය ඉවත් කිරීමේදී ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

23 S II

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# දේශපාලන විද්‍යාව II

කාලය පැය තුනයි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි.)

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.**
- **පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද,**
- **දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක්ද,**
- **තුන්වැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද වන සේ තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය පහත පැති ඔස්සේ විස්තර කරන්න.
    (i) දේශපාලනය කිරීම.
    (ii) දේශපාලනය හැදෑරීම. (10 x 2 = 20)

02. ප්‍රජාතන්ත්‍රවාදය අර්ථ කථනය කර ප්‍රජාතන්ත්‍රවාදයේ යහපත් අයහපත් ලක්ෂණ නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. (i) ඒකීය සංධීය ආණ්ඩුක්‍රමවල ලක්ෂණ විස්තර කරන්න.
    නැතහොත්
    (ii) ජනාධිපති ආණ්ඩුක්‍රමය හා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය අතර පවතින වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 20)

## II කොටස

04. ශ්‍රී ලංකාවේ යටත් විජිත පාලනයේ ආර්ථික හා සමාජ පරිවර්තන පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. ඩොනොමෝර් ප්‍රතිසංස්කරණ වල පහත මාතෘකා විස්තර කරන්න.
    (i) සර්ව ජන ඡන්ද බලය
    (ii) රාජ්‍ය මන්ත්‍රණ සභාව (10 x 2 = 20)

06. 1948 සහ 1972 ප්‍රතිසංස්කරණ ඔස්සේ පහත කරුණු විමසන්න.
    (i) නීති සම්පාදනය කිරීමේ ව්‍යවස්ථාදායක බලතල
    (ii) දේශපාලන විධායකයේ තත්වය (10 x 2 = 20)

07. 1978 ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකා 2ක් විමසන්න.
   (i) 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය
   (ii) 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය
   (iii) 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය (10 x 2 = 20)

   නැතහොත්

   (i) ජනාධිපති තෝරා ගන්නා අයුරු
   (ii) ජනාධිපති තනතුරෙන් ඉවත් කරන අයුරු (10 x 2 = 20)

## III කොටස

08. (i) ඔබ ගැටුම් නිර්වචනය කරන්නේ කෙසේද?
   (ii) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමේ සාධක දෙකක් පැහැදිලි කරන්න. (10x 2= 20)

09. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද?
   (ii) ඇමෙරිකානු ආණ්ඩුක්‍රමයේ මූලික ලක්‍ෂණ විස්තර කරන්න. (10 x 2 = 20)

10. පහත මාතෘකා වලින් 2කට කෙටි සටහන් ලියන්න.
   (i) මානව අයිතිවාසිකම්
   (ii) නීතියේ ආධිපත්‍යය
   (iii) පොදු රාජ්‍ය මණ්ඩලය
   (iv) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ
   (v) එක්සත් ජාතීන්ගේ සංවිධානය (10 x 2 = 20)

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019 - දේශපාලන විද්‍යාව

**පිළිතුරු පත්‍රය**

# I කොටස

| | | |
|---|---|---|
| (01) - 1 | (11) - 1 | (21) - 3 |
| (02) - 5 | (12) - 5 | (22) - 1 |
| (03) - 2 | (13) - 5 | (23) - 5 |
| (04) - 5 | (14) - 1 | (24) - 4 |
| (05) - 1 | (15) - 4 | (25) - 3 |
| (06) - 5 | (16) - 3 | (26) - 2 |
| (07) - 4 | (17) - 1 | (27) - 1 |
| (08) - 4 | (18) - 1 | (28) - 1 |
| (09) - 3 | (19) - 1 | (29) - 2 |
| (10) - 1 | (20) - 1 | (30) - 2 |

31. (i) දේශපාලනය
(ii) ඍජු හා වක්‍ර ලෙස / සමාජ භාවිතයක් ලෙස
32. (i) ප්‍රතිමානීය හෙවත් සදාචාරාත්මක න්‍යාය. (ii) විද්‍යාත්මක හෙවත් යථාර්ථවාදී න්‍යායන්.
33. (i) ඇරිස්ටෝටලියානු අර්ථය - රාජ්‍ය ඉහළම මනුෂ්‍ය සංවිධානයකි.
(ii) වෙබේරියානු අර්ථය - සියලු සංවිධිත බලයන්ගේ එකතුවකි රාජ්‍යය.
34. (i) රාජ්‍යය (ii) ආණ්ඩු
35. (i) රාජ්‍යයේ භූමිය (ii) ස්වාධිපත්‍යය
36. (i) රාජ්‍යයේ ස්වරූපය (ii) බටහිර චින්තනයේ මතුවීම. (iii) වහල් සමාජය
37. (i) නිෂේධනීය සාමය (ii) සාධනීය සාමය
38. (i) ආර්ථික සාධකයක් වශයෙන් (ii) දේශපාලනික සාධකයක් වශයෙන්
39. (i) ජනතාවට උත්තර දියයුතු බව.(ii) වගකීමේ අර්ථයෙන් ක්‍රියා කිරිම ආදී ඕනෑම දෙකක්
40. (i) ව්‍යවස්ථානුකූල භක්තිය (ii) ජනතා සිතුම් පැතුම් සමග ව්‍යවස්ථාව වෙනස්වීම.
41. (i) මධ්‍යම රජයේ නීතිවල උත්තරීතර භාවයට අදාළ විධිවිධාන. (ii) යුද්ධය සම්බන්ධ බලය
(iii) වෙළඳාම සම්බන්ධ විධිවිධාන (iv) බදු අයකරගැනීමටහා වියදම් කිරිමට ඇති බලය යන කරුණුවලින් දෙකකි.
42. (i) පාර්ලිමේන්තුව පනවන නීති අධිකරණයට විෂයය නොවීම.
(ii) ඕනෑම නීතියක් පැනවීමට සංශෝධනයට පූරණ බලයක් පැවතීම.
43. (i) ආණ්ඩුවක් පිහිටුවීමේදී (ii) අයවැය සම්මත කිරීමේදී (iii) විශ්වාසභංගයක් සම්මත කිරීමේදී
44. (i) ව්‍යවස්ථාදායක සභාව (ii) විධායක සභාව
45. (i) දේශපාලනය වෙත විශාල පිරිසක් මුදාහැරීම.
(ii) සුභසාධන සේවාවන්හි ඇතිවූ ප්‍රගතිය යනාදී කරුණු.
46. (i) රැජින (අග්‍රාණ්ඩුකාරවරයා) (ii) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
(iii) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය යන කරුණුවලින් දෙකක්.
47. (i) පනත් කෙටුම්පත් ජනමත විචාරණයට යොමු කිරීම.
(ii) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනත් කෙටුම්පත් නිශේධනය කිරිම.
48. (i) පාර්ලිමේන්තුවේ බලය. 2/3 බලය (ii) පාර්ලිමේන්තුවේ 2/3 බලය බලය හා ජනමත විචාරනය.
49. (i) අවුරුදු 6 සිට 5 දක්වා අඩුකිරීම. (ii) වාර දෙකකි.
50. (i) ජනාධිපති විසින්
(ii) පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කොට බහුතර කැමැත්ත ලබාගැනීමෙන් පසුවය.

# I කොටස

01. මෙම ප්‍රශ්නය පැති දෙකකින් විග්‍රහ විය යුතුය.
(i) දේශපාලනය කිරීම. (ii) දේශපාලනය හැදෑරීම වශයෙනි.
02. ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති විවිධ නිර්වචන ඇසුරින් ප්‍රජාතන්ත්‍රවාදය අර්ථ දැක්වීම.
* සර්වජන ඡන්දබලය සහ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය
* මහජන ඡන්දයෙන් පත්කරන ව්‍යවස්ථාදායකය.
* නිතිපතා පැවැත්වෙන මැතිවරණ සහ ඡන්දදායක සහභාගිත්වය.
* ස්වාධීන අධිකරණ * අධිපති ද්විපක්ෂ ක්‍රමය
* මූලික අයිතිවාසිකම් * බලය විමධ්‍යගත කිරීම. යහපත් ලක්ෂණ යි.

ප්‍රජාතන්ත්‍රවාදී නොවන ලක්ෂණ අතර,
* ව්‍යවස්ථාදායකය සහ අධිකරණය විධායකයේ බලපෑම යටතට ගෙනඒම, මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම.
* දේශපාලන ප්‍රචණ්ඩත්වය හා සිවිල් යුද්ධය.
* නිදහස් සාධාරණ මැතිවරණ උල්ලංඝණය කිරීම යනාදී අංග ලක්ෂණ.

03. (i) ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
* රාජ්‍යයේ ස්වාධිපති බලය තනි ජාතික ආයතනයකට පවරා තිබීම.
* ස්වාධිපත්‍ය බලය මුලුමනින්ම පැවරී ඇත්තේ ජාතික ආණ්ඩුව වෙත වීම.
* මධ්‍යම ජාතික ආණ්ඩුව විසින් පහළ මට්ටමේ ආයතන අහෝසි කිරීමේ අධිකාරිත්වය හිමිවීම.
* ව්‍යවස්ථාදායකයේ උත්තරීතරත්වය පිළිබිඹු වන අන්දමට ඒකීය රාජ්‍යවල ජාතික ව්‍යවස්ථාදායකය ඒක මණ්ඩලවාදය මත පදනම්වීම.
* ආණ්ඩුක්‍රමය අසංකීරණ සහ කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයක් වීම.

**<u>සංඝීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ :</u>**
* ආණ්ඩු වට්ටම් දෙකකින් සමන්විත වීම.
* මධ්‍යම හා ප්‍රාන්ත ඒකකවලට විශේෂිත කාර්යයන් පැවරී තිබීම.
* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය ලිඛිතවීම සහ එමගින් බලතල බෙදාතිබීම.
* ව්‍යවස්ථාව අනම්‍ය වීම.
* ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වීම.
* අධිකරණ ස්වාධීනතාවය ක්‍රියාත්මක වීම.
* ඒකීය ආණ්ඩුක්‍රමය විකාශනාත්මක රාජ්‍ය මාදිලියක් වීම සහ
* සංඝීය ආණ්ඩුක්‍රමය සුවිශේෂී තත්වයන් යටතේ හිතාමතා සකස් කරගත් එකක් වීම යන මෙම ලක්ෂණ වෙන් වෙන්ව හෝ සංසන්දනාත්මකව ලියාතිබීම ප්‍රමාණවත්ය.

නැතහොත්

(ii) ජනාධිපති ආණ්ඩුක්‍රමය හා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය අතර පවතින වෙනස්කම්,
* ප්‍රථමයෙන් ආණ්ඩුක්‍රම දෙක හැඳින්වීම.
* ආයතයනික සම්බන්ධතාවන්හි පවතින වෙනස
* ආයතන එකිනෙකින් පාලනය වීමේ තත්ත්වය

* කාර්යක්ෂමතාවය පිළිබඳ මූලධර්මය
* ප්‍රජාතන්ත්‍රවාදී භාවය පිළිබඳ මූලධර්මය
* සංවරණ තුලන ක්‍රම මත ගොඩනගා තිබීම.

## II කොටස

04. ශ්‍රී ලංකාවේ යටත් විජිත පාලනයේ ආර්ථික හා සමාජ පරිවර්තන තල දෙකක් යටතේ සිදුවිය.
(i) යටත් විජිත ධනවාදයේ ආරම්භය හා ව්‍යාප්තිය
(ii) යටත් විජිත සමාජ පරිවර්තන ඔස්සේ පිළිතුර විස්තර විය යුතුය.

05. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ලංකාවේ දේශපාලන ක්‍රමය තුළ වෙනස්කම් රාශියක් ඇතිකිරීමට සමත්විය.
ඒ යටතේ,
* සර්වජන ඡන්ද බලය * වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදීම.
(i) ඡන්ද බලය නිර්දේශ කිරීමට හේතු දැක්විය යුතුය.
* ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරු කිරීම. * නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව පෙළඹවීම.
* දේශපාලනඥයින් ජනතාවට වගකීමට නැඹුරුවීම.
* දේශපාලන පක්ෂ ආරම්භ වීමට පදනම වැටීම. * සමාජ සජීවීකරණය වේගවත් කිරීම.
* සමාජ සුභසාධනය වර්ධනය වීම යන කරුණු ඇසුරින් පිළිතුර විස්තර කල යුතුය.
(ii) රාජ්‍ය මන්ත්‍රණ සභාව :
* ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයකි. එය රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හඳුන්වයි.
* මෙහි සංයුතිය නියෝජිතයින් තෝරා පත්කරගත් ආකාරය සහ බලතල සඳහන් කළ යුතුය.

06. (i) 1948 ප්‍රතිසංස්කරණ යටතේ නීති සම්පාදන බලතල සීමා වූ අතර ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ක්‍රියාත්මක විය.
* 1972 ප්‍රතිසංස්කරණ යටතේ ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් වන ජාතික රාජ්‍ය සභාව ක්‍රියාවට නැගුණි.
* 1972 ව්‍යවස්ථාව පාර්ලිමේන්තු ස්වාධිපති මූලධර්මය මත පදනම් වී තිබීම සහ ජනතා පරමාධිපතිත්වය ජනතාවසතු බව විස්තර විය යුතුය.
* එම බලය ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය හරහා ක්‍රියාවට නැගු ආකාරය පෙන්වාදිය යුතුය.
* 1948 බලතල සීමා වූ ආකාරය 29 - 2 වගන්තිය සහ

(ii) විධායකයේ තත්වය (මෙම පිළිතුර වෙන් වෙන්ව හෝ සංසන්දනය කර ලිවීම ගැටළු නොවේ)
* 1948 හා 1972 ප්‍රතිසංස්කරණවල ප්‍රධානතම පාලන ආයතනය විධායකය වූ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි. එය ව්‍යවස්ථාවේ පැවති දේශපාලන විධායකයයි.
* මෙම ප්‍රතිසංස්කරණ දෙකේම ආණ්ඩුවේ නායකත්වය අගමැතිවරයා සතුවිය.
* 1948 නාමික විධායකය වන අග්‍රාණ්ඩුකරු විසින් වැඩි ආසන ගණනක් ගත් පක්ෂයේ පුද්ගලයා අගමැති ලෙස පත්කර ඇත.
* 1972 ආණ්ඩුක්‍රමය යටතේ ජාතික රාජ්‍ය සභාවේ බහුතර විශ්වාසය දිනාගත් පුද්ගලයා නාමික විධායකය වන ජනාධිපති විසින් පත්කර ඇත.
* අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ තීරණය කිරීම, විෂයයන් නියම කිරීම, ආණ...... අගමැති විසින් කරනුලැබේ.
* ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ වශයෙන් බලතල ක්‍රියාවට නැගෙන ආකාරය විස්තර විය යුතුයි.
* විෂයන් වෙනස් කිරීම, අමාත්‍යධුරවලින් ඉවත් කිරීම, ඉහළ අධිකරණ විනිසුරුවන් පත්කිරීම, අමාත්‍යාංශ ලේකම්වරු, ත්‍රිවිධ හමුදාපතිවරු යනාදී ඉහළ පත්කිරීම් සියල්ලේම ප්‍රමුඛත්වය අගමැතිවරුන් සතුය.
* ආණ්ඩුක්‍රම දෙකෙහිම අගමැතිගේ තත්වය සමාන වන අතර පත්කිරීමේදී පත්කරන පුද්ගලනිල නාමයෙහි වෙනසක් ඇත.

07. (i) , (ii), (iii) මේ ප්‍රශ්නවලදී ව්‍යවස්ථා සංශෝධන වල පසුබිම, ඒ යටතේ පිහිටවූ ආයතන සංයුතිය,ඥ හා ප්‍රායෝගික තත්වය පැහැදිලි කරන්න.

## III කොටස

08. (i) ගැටුම් සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති නිර්වචන ඇසුරින් කරුණු පෙන්වාදිය යුතුය. J.L. Hocker,WW Wilmot, Johan Galtung, Louis, Kries Burg, Christoper Mitchell වැන්නන්ගේ නිර්වචන තුළින් ගැටුම් අර්ථ දැක්විය හැකිය. ශබ්ද කෝෂ අරුත්වලින්ද විග්‍රහ කළ හැක. ගැටුම, ආරවුල, රණ්ඩුව, එදිරිවාදිකම, තරගකාරිත්වය, අරගල යන ක්‍රියාවන් තුළින් පද අතර වෙනස්කම් ගත්විටද ගැටුම්වල පරිමාව තීව්‍ර බව හා ස්වභාවය පිළිබඳ වෙනස්කම් පවතින බව පෙන්වා දිය හැක.
* මිනිසුන් අතර ගැටුම් ඇතිවන ප්‍රධාන ස්ථරද විස්තර විය යුතුය.

(ii) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමේ පහත සාධක විස්තර විය යුතුය.
* ව්‍යුහාත්මක සාධක* ආර්ථික හා සමාජ සාධක
* දේශපාලන සාධක. * සංස්කෘතික සාධක

09. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් දේශපාලන හා නෛතිකව චින්තකයින් විසින් දක්වා ඇති අර්ථකථන ඇසුරින් මේ පිළිබඳව හඳුන්වා දිය හැක.
(ii) ඇමෙරිකානු ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ අතර,
* ලිඛිත හා අනම්‍ය ව්‍යවස්ථාවක් තිබීම.
* සම්ප්‍රදායික සිරිත් විරිත් හා අධිකරණ තීන්දු මත පෝෂණය වී තිබීම.
* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල බෙදා තිබීම.
* සංවරණ තුලන ක්‍රමය අන්තර්ගතව තිබීම.
* අයිතිවාසිකම් ප්‍රඥප්තිය ඇතුළත්කර තිබීම.
* අධිකරණ විමර්ෂණය
* මහජන පරමාධිපත්‍ය සිද්ධාන්තය මත පදනම් වීම.
* සමූහාණ්ඩුවාදය
* ද්විත්ව පුරවැසිභාවය හිමිවීම.
* ජනාධිපති ආණ්ඩුක්‍රමයක් විම. යන කරුණු විස්තර විය යුතුය.

10. (i) මානව අයිතිවාසිකම් හඳුන්වා ඒවා ආරක්ෂාකිරීමට නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල යොදා ඇති විධි විධාන දැක්විය යුතුය.
(ii) නීතියේ ආධිපත්‍ය සංකල්පය නිර්වචනය ඇසුරින හඳුන්වා ප්‍රායෝගික වැදගත්කම පෙන්වා දී තිබිය යුතුය.
(iii) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ ආරම්භය, විකාශය හා එහි දැකිය හැකි ලක්ෂණ විස්තර කර තිබිය යුතුය.
(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය එහි ආරම්භය ආයතනික ව්‍යුහය හා කාර්යන් දක්වා තිබිය යුතුය.
(v) පොදු රාජ්‍ය මණ්ඩලය ආරම්භය, ආයතනික ව්‍යුහය හා එහි කාර්යන් හා වර්තමාන තත්වය ලංකාව ඇසුරින් විමසා තිබිය යුතුයි.